## මුදල් හා පරිපාලන අංශය

මුදල් හා පරිපාලන අංශයේ ප්‍රධාන  කාර්යයන් වනුයේ කාර්යක්ෂම කළමණාකරන ව්‍යුහයකට ගැලපෙන පරිදි ශක්තිමත් තොරතුරු තාක්ෂණ පසුතල පහසුකමින් සහිතව වඩාත් දියුණු අභ්‍යන්තර පාලන ක්‍රමයක් හා ශක්තිමත් පරිපාලන හා මූල්‍ය කළමණාකරන ක්‍රමයක් සකස් කිරීමයි. සෙස් ආදායම එකතු කිරීම, වාර්ෂික ගාස්තු හා ලියාපදිංචි ගාස්තු එකතු කිරීම සහ ඒවා නිසි පරිදි ආයෝජනය කිරීම, නියමිත අයවැය පාලන රාමුවක් තුල විය පැහැදම් කිරීම වගේම නිසිකලට මූල්‍ය වාර්තා සකස් කිරීම හා ඒවා ඉදිරිපත් කිරීමේ වගකීම මෙම අංශය සතුව පවතී. ඊට අමතරව අවශ්‍ය ප්‍රමාණයට කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් බඳවා ගනිමින් ඔවුන්ගේ කාර්යභාරය නිසි පරිදි ඉටු කළ හැකි වන පරිදි දැනුම වර්ධනය කිරීමත්, පරිපාලන හා මූල්‍ය රෙගුලාසි සකස් කිරීමත්, ටෙන්ඩර් පටිපාටියක් තුල භාණ්ඩ හා සේවා සැපයීමත්, කාර්ය මණ්ඩලයේ සිය සේවාවන් කාර්යක්ෂමව ඉටුකරගත හැකි වන පරිදි හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මෙම අංශයේ කාර්ය භාරය වේ.

## මණ්ඩලය මගින් නිකුත් කර ඇති ප්‍රකාශන

- "රක්ෂණයේ භාවිතය හා වෙළඳපොළ" ග්‍රන්ථය (දෙමළ පරිවර්තනය) - නිමල් පෙරේරා විසින් රචිත
- ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය පිළිබඳ අත්පත්‍රිකා (සිංහල / දෙමළ)
- රක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ අත්පත්‍රිකා (සිංහල / දෙමළ)
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිළිබඳව අත්පත්‍රිකා (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)

## රක්ෂණ කටයුතු හා සම්බන්ධ ආයතන

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**
11 වන මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
එචලන් චතුරශ්‍රය, කොළඹ 01.
දුරකථන: 011 2396184-9
ෆැක්ස්: 011 2396190
ඊ මේල් ලිපිනය - info@ibsl.gov.lk
වෙබ් අඩවිය - www.ibsl.gov.lk

**ශ්‍රී ලංකා රක්ෂණ සංගමය**
සභාපතිගේ කාර්යාලය
143A, වජිර පාර,
කොළඹ 05.
දුරකථන: 011 5635582
ෆැක්ස්: 0112585785

**ශ්‍රී ලංකා තැරැව්කරුවන්ගේ සංගමය**
ජේ ඉන්ෂුවරන්ස් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවේට්) ලිමිටඩ් (භාරේ)
අංක. 252 A /1/5
මෙතඩිස්ට් සෙන්ට්‍රල් ගොඩනැගිල්ල
ගාලු පාර, කොළඹ 03
දුරකථන: 011 2437959
ෆැක්ස්: 011 2451934

**ශ්‍රී ලංකා රක්ෂණ ආයතනය**
1 වන මහල
වයි. එම්. සී. ඒ. ගොඩනැගිල්ල
143, ශාන්ත මයිකල් මාවත
කොළඹ 03
දුරකථන: 011 2431426, 011 2432050
ෆැක්ස්: 011 5337731
ඊ මේල් ලිපිනය - slii@sltnet.lk

**රක්ෂණ ඔම්බුඩ්ස්මන්වරයා**
143 A, වජිර පාර, කොළඹ 05.
දුරකථන: 011 4528671-2,
ෆැක්ස්: 011 4528670
ඊ මේල් ලිපිනය - info@insuranceombudsman.lk
වෙබ් අඩවිය - www.insuranceombudsman.lk

# ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය



IBSL
INSURANCE
BOARD OF SRI LANKA

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**
**රක්ෂණ කර්මාන්තයේ නියාමන ආයතනයයි**
**(මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය යටතේ පිහිටුවා ඇත)**

## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වර්ෂ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අනුව 2001 මාර්තු මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පිහිටුවන ලද රාජ්‍ය ආයතනයකි.

## ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අරමුණ හා වගකීම

ශ්‍රී ලංකාවේ රක්ෂණ ව්‍යාපාරය, රක්ෂණ ඔප්පු හිමියන්ගේ හා අනාගත ඔප්පු දරන්නන්ගේ සම්බන්ධතා ආරක්ෂා වන ආකාරයෙන් කරගෙන යනු ලබන බවට වගබලා ගැනීම.

## කාර්යයන්

- ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාරය කර ගෙන යන තැනැත්තන් රක්ෂණකරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම;
- රක්ෂණ තැරැව්කරුවන් වශයෙන් තැනැත්තන් ලියාපදිංචි කිරීම;
- රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම හා විධිමත් කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම;
- රක්ෂණ කර්මාන්තය සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම;
- මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ, කාර්ය ඉටු කිරීමේ හා කර්තව්‍ය කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම;
- නිශ්චල වූ හෝ චංචල වූ හෝ දේපළ කිසිවක් අත්කර ගැනීම හා දැරීම, ඒ දේපළ විකිණීම, බද්දට දීම, උකස් කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;
- මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය යම් ගිවිසුම්වලට ඇතුළත් වීම;
- මේ පනත යටතේ යථා පරිදි මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටුකිරීම හා කර්තව්‍ය කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු ක්‍රියා කිරීම.

## ක්‍රියාකාරී අංශ




## නීති අංශය

නීති අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ නීතිමය කරුණු සම්බන්ධයෙන් මණ්ඩලයට උපදෙස් ලබාදීමයි. මේ අනුව ශක්තිමත් නීතිමය රාමුවක් සකස් කිරීම සඳහා, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතට අවශ්‍ය කෙරෙන රීතීන්, නියෝග හා විධානයන් සකස් කිරීම, අවශ්‍ය කෙරෙන සංශෝධන සෑදීම හා අනිකුත් අදාල උප නීතීන් සෑදීම කරනු ලබයි. තවද රක්ෂණ ව්‍යාපාරික කටයුතු හා රක්ෂණ තැරුව්කාර ව්‍යාපාරික කටයුතු කිරීම පිණිස ලියාපදිංචිවීම සඳහා මණ්ඩලයට ඉදිරිපත් කෙරෙන ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර ඒ සඳහා අනුමැතිය දීමද කරනු ලබයි. ඊට අමතරව, රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරුව්කාර සමාගම්වල ප්‍රධාන නිලධාරීන්ගේ හා රක්ෂණ සමාගම්වල අධ්‍යක්ෂවරුන් පත් කිරීම පිළිබඳ ඉල්ලුම් පත්‍ර පරීක්ෂා කර බලා ඒ පිළිබඳ අනුමැතිය දීමද මෙම අංශය විසින් කරනු ලබයි.

## අධීක්ෂණ අංශය

අධීක්ෂණ අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ රක්ෂණ සමාගම් හා රක්ෂණ තැරුව්කාර සමාගම්වල නුබුන්වත් භාවය හා මූල්‍යමය ස්ථාවරත්වය සහතික කිරීමයි. මේ අනුව මෙම අංශය විසින් සමාගම් හා සම්බන්ධව ස්ථානීය හා ස්ථානීය නොවන අධීක්ෂණ ක්‍රියාවලියන් ක්‍රියාත්මක කරනු ලබයි. තවද, රක්ෂණ ව්‍යාපාර කිරීම පිණිස මණ්ඩලයට ලැබෙන නව ඉල්ලුම් පත්‍ර අනුමත කිරීමේ කාර්යය සඳහා ඒවායේ ව්‍යාපාර සැලසුම්, මූල්‍යමය ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘතීන් පිළිබඳ පරීක්ෂා කිරීම කරනු ලබයි.

ඊට අමතරව ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය වෙනුවෙන් අවදානම් සංවේදී අවම ප්‍රාග්ධන ආකෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශය දැනට කටයුතු යොදා ඇත. දේශීය හා විදේශීය රක්ෂණ වෙළඳපොළේ සිදුවන වෙනස්කම්වලට අනුකූලවන පරිදි රකෂණ කර්මාන්තයේ හා එහි අනිකුත් පාර්ශවයන් සමඟ එකතුව කටයුතු කිරීම අඛණ්ඩව කරනු ලබයි.

## විමර්ශන අංශය සහ වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා ඒකකය

විමර්ශන අංශයේ ප්‍රධාන කාර්යය වනුයේ අසාධාරණ ලෙස රක්ෂණ හිමිකමක් නොගෙවූ අවස්ථාවක එම අසාධාරණයට ලක්වුනු අය විසින් කරනු ලබන පැමිණිලි හා රක්ෂණ අතර මැදියන් විසින් කරනු ලබන විෂමාචාරයන් සාවද්‍ය පරිහරණය කිරීම් පිළිබඳව රක්ෂණ ඔප්පුහිමියන් විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීමයි. පනතේ විධිවිධාන හා නියෝග වලට අනුව සකස් කර ඇති රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් පිළිබඳව ලැබෙන පැමිණිලිද විභාග කරන අතර, ඊට අමතරව පනතේ විධිවිධාන හා නියෝග හා සංශෝදන වලට අනුකූල නොවන පරිදි සදුවන අවිධිමත් ක්‍රියාවක් හා අනුකූල නොවීම සම්බන්ධව මණ්ඩලයෙන් හෝ වෙනත් ආකාරයකට ලැබෙන පැමිණිලි විභාග කරනු ලබයි.

විමර්ශන අංශයට අනුබද්ධව ඇති වෙළඳපොළ සංවර්ධන හා බාහිර සබඳතා අංශයෙන් කෙරෙනුයේ රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනය උදෙසා රක්ෂණය සම්බන්ධව අවබෝධය වැඩි කිරීමට, මහජනතාව සඳහා විවිධ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙම ඒකකය විසින් රක්ෂණ විෂය සම්බන්ධව විවිධ වැඩ සටහන් මාධ්‍ය තුළින් ගෙන යන අතර විවිධ ප්‍රකාශණ මුද්‍රණය කර බෙදා හැරීමද කරනු ලබයි.